1.0 අනුවාදය
2018 නොවැම්බර්

# ආගමික ප්‍රජාවන් සඳහා වාර්තා කළ හැකි චර්යා යෝජනා ක්‍රමය පිළිබඳ මාර්ගෝපදේශය

COMMISSION FOR CHILDREN
AND YOUNG PEOPLE

වියාචනය: මෙම මාර්ගෝපදේශයේ සාමාන්‍ය තොරතුරු පමණක් අඩංගු වේ. එය ආගමික ප්‍රජාවන්ට වාර්තා කළ හැකි චර්යා යෝජනා ක්‍රමය පිළිබඳව සහය වීමට සකසා ඇත. මෙම මාර්ගෝපදේශය නිෂ්පාදනය කිරීමේදී සියලු සැලකිලි ගෙන ඇති නමුත් එමගින් නීති උපදෙස් ලබා දීමට අදහස් නොකෙරේ. නීති සම්පාදනය සහ නෛතික අවශ්‍යතා කාලයත් සමග වෙනස් වන හෙයින්, සංවිධාන තමන්ට අදාළ වන නීතිමය අවශ්‍යතා සනාථ කළ යුතු අතර ඒවායේ නිශ්චිත තත්ත්වය පිළිබඳව නීති උපදෙස් ලබා ගත යුතුය.

## අපයෝජනයෙන් ළමයින් ආරක්ෂා කිරීම

ළමා අපයෝජන කිසි විටෙක පිළිගත නොහැක. ළමයින් ආරක්ෂා කිරීම සහ දරුවන් සුරක්ෂිත බව සහතික කිරීම සඳහා අප සියලු දෙනාටම නීතිමය හා සදාචාරාත්මක බැඳීමක් තිබේ.

අපයෝජනය වැළැක්වීම සහ නැවැත්වීම සඳහා අපගේ ආගමික ප්‍රජාවන් ඇතුළු අප සියලු දෙනා අපගේ සංවිධාන තුළ පුරුදු සහ හැසිරීම් තහවුරු කළ යුතුය. අපයෝජන චෝදනා සමග තරයේ, ඉක්මනින් හා සාධාරණව කටයුතු කිරීමට අපගේ සංවිධාන සහ ප්‍රජාවල වාර්තා කිරීමේ යාන්ත්‍රණ අවශ්‍ය වේ. ළමයින් අපයෝජනය කිරීමේ චෝදනා සම්බන්ධයෙන් ආගමික සංවිධාන කටයුතු කළ යුතු ආකාරය මෙම ලේඛනය කෙටියෙන් විස්තර කරයි.

වික්ටෝරියාවේ නීති හා රෙගුලාසි හඳුන්වා දී ඇත්තේ ළමා අපයෝජන නවත්වන ආකාරය සහ අපයෝජන චෝදනා කළමනා කරන්නේ කෙසේද යන්න පිළිබඳව ආයතන අපේක්ෂා කරන දේ වෙනස් වන බැවිනි. ළමා අපයෝජනය සහ ළමයින් සම්බන්ධ විෂමාචාර චෝදනා පිළිබඳව සියලු ආගමික සංවිධාන වාර්තා කිරීම හා විමර්ශනය කිරීම අවශ්‍ය කෙරේ.

වික්ටෝරියානු රජය විසින් 2013 දී පිහිටුවන ලද **ළමා හා තරුණයින් සඳහා වූ කොමිෂන් සභාව (කොමිසම),** ළමා අපයෝජන සහ ළමයින් සම්බන්ධ විෂමාචාර චෝදනා වාර්තා කිරීමට, විමර්ශනය කිරීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්වීමට ආයතනවලට අවශ්‍ය වන **වාර්තා කළ හැකි චර්යා යෝජනා ක්‍රමය (යෝජනා ක්‍රමය)**[1] පරිපාලනය කරයි. කොමිසමේ සම්බන්ධතා තොරතුරු මෙම ලේඛනයේ අවසානයේ දක්වා ඇත.

1 මෙම යෝජනා ක්‍රමය *2005 ළමා සුබසාධන හා සුරක්ෂිතතා පනත* (පනත) මගින් ස්ථාපිත කර ඇත.

## මෑතකාලීන සිදුවීම්



## වාර්තා කළ හැකි චර්යා යෝජනා ක්‍රමය කුමක්ද?

ළමයින් කෙරෙහි සැලකිල්ල, අධීක්ෂණය සහ අධිකාරය ඇති ඇතැම් සංවිධානවල ළමුන් සම්බන්ධ බරපතල විෂමාචාර චෝදනා පිළිබඳ කොමිසම දැනුවත්ව සිටීම සහතික කිරීම සඳහා මෙම යෝජනා ක්‍රමය සැලසුම් කර ඇත.

කොමිසමේ කාර්යභාරයට ඇතුළත් වන්නේ:

- සංවිධානවල චෝදනාවලට දක්වන ප්‍රතිචාර ස්වාධීනව අධීක්ෂණය කිරීම සහ අධීක්ෂණය කිරීම සහ මෙම ප්‍රතිචාර වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම
- චෝදනා එල්ලවන සංවිධානවලට සහය දීම සහ මඟ පෙන්වීම.

ඔවුන්ගේ සේවකයින් සහ ස්වේච්ඡා සේවකයින් විසින් කරන ලද ළමා අපයෝජන සහ ළමයින් සම්බන්ධ විෂමාචාර චෝදනාවලට සංවිධාන දක්වන ප්‍රතිචාර වැඩි දියුණු කිරීමට මෙම යෝජනා ක්‍රමය අපේක්ෂා කරයි.

## ආගමික සංවිධානවල අවශ්‍යතා

ආගමික සංවිධාන දැන් බැඳී සිටින කාරණා වන්නේ:

- **සංවිධානයේ ප්‍රධානියා**[2] හඳුනා ගැනීම හෝ නම් කිරීම - ළමයින් අපයෝජනය කිරීමේ ඕනෑම චෝදනාවක් සංවිධානයේ කළමනාකරණයට මූලික වශයෙන් වගකිව යුතු පුද්ගලයා, සහ
- සංවිධානයේ ප්‍රධානියා සමඟ, අපයෝජනය වැළැක්වීමට සහ නැවැත්වීමට පද්ධති සහ සිදුවිය හැකි ඕනෑම චෝදනාවකට ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියා පටිපාටි ස්ථාපිත කිරීම.

සංවිධානයේ ප්‍රධානියා පත් කිරීම සම්බන්ධව වැඩිදුර තොරතුරු https://ccyp.vic.gov.au/reportable-conduct-scheme/for-organisations/#TOC-1 හි ලබාගත හැක.

ළමා අපයෝජන හා ළමයින් සම්බන්ධ විෂමාචාර චෝදනා සියල්ල බැරෑරුම් ලෙස සලකන ලෙස නීතියෙන් ආගමික සංවිධානවලට නියම කර ඇත. වාර්තා කළ හැකි හැසිරීමක් හෝ වාර්තා විය හැකි හැසිරීමක් සිදුවිය හැකි බවට යමෙකුට සාධාරණ විශ්වාසයක් තිබේ නම්, ආගමික සංවිධානයේ ප්‍රධානියා මෙය කොමිසමට වාර්තා කළ යුතුය. වාර්තා කළ හැකි හැසිරීම හඳුනාගෙන ඒවා සමඟ කටයුතු කරන්නේ කෙසේද යන්න පිළිබඳ කෙටි සාරාංශයක් පහත දැක්වේ.

> **වාර්තා කළ හැකි හැසිරීම පිළිබඳ චෝදනා**
>
> - **ලිංගික අපරාධ**
> - **ලිංගික විෂමාචාරය**
> - **කායික හිංසනය**
> - **සැලකිය යුතු චිත්තමය හෝ මානසික හානියක් සිදු කරන හැසිරීම**
> - **සැලකිය යුතු නොසලකා හැරීම**

## චෝදනාවක් හඳුනා ගැනීම

වාර්තා කළ හැකි හැසිරීම් හෝ විෂමාචාර ක්‍රියා පිළිබඳ වාර්තා කිරීමට හා විමර්ශනය කිරීමට ආයතනවලට සිදු වේ. කොමිෂන් සභාවට වාර්තා කළ යුතු හැසිරීම් වර්ග පහක් ඇත:

- දරුවෙකුට, සමඟ, හෝ දරුවෙකු සිටින විට සිදුවන ලිංගික අපචාර
- දරුවෙකුට, සමඟ, හෝ දරුවෙකු සිටින විට සිදුවන ලිංගික විෂමාචාර
- දරුවෙකුට, සමඟ, හෝ දරුවෙකු සිටින විට සිදුවන කායික හිංසන
- දරුවෙකුට සැලකිය යුතු හැඟීම් හෝ මානසිකව හානියක් සිදු කරන හැසිරීම්
- දරුවෙකු සැලකිය යුතු ලෙස නොසලකා හැරීම්.

සේවකයින්, ස්වේච්ඡා සේවකයන්, නිලධාරීන්, ආගමික නායකයින්, රැක බලා ගන්නන් හෝ කොන්ත්‍රාත්කරුවන් ඇතුළුව ආගමික සංවිධානයක සේවය කරන හෝ ඊට සම්බන්ධ ඕනෑම කෙනෙකුට එරෙහිව චෝදනා ඉදිරිපත් කළ හැකිය. යමෙකු යෝජනා ක්‍රමයෙන් ආවරණය වන්නේ දැයි ඔබ අපැහැදිලි නම්, කොමිසම  සම්බන්ධ කරගන්න.

---

2 කවුරුන් නම් කළ යුතුද යන්න තීරණය කිරීමේදී, ඔබ සලකා බැලිය යුතු වන්නේ එම පුද්ගලයා:
- සංවිධානයේ ජ්‍යෙෂ්ඨ පුද්ගලයෙක් වීම
- සංවිධානයේ ප්‍රධානියාගේ වගකීම් ඉටු කළ හැකි වීම
- වික්ටෝරියාවේ පදිංචි වීම
- පත්කිරීමට එකඟ වීම

ඉහත විස්තර කර ඇති පුද්ගලයින්ගේ හැසිරීම් පිළිබඳ චෝදනා පහත අවස්ථාවලදී පවා වාර්තා කළ යුතුය:

- ඔවුන්ට ළමයින්ට සෘජු සම්බන්ධතා නොමැති විට
- හැසිරීම ඔවුන්ගේ කාර්යභාරයට පිටින් හෝ සංවිධානය සමඟ ඇති වගකීම්වලින් පිටත සිදු වූ විට.

ඕනෑම අයෙකුට වාර්තා කළ හැකි චෝදනාවක් එල්ල කළ හැක. වාර්තා කළ හැකි චෝදනාවක් මතු කිරීම සඳහා, සංවිධානයේ සේවකයෙකු හෝ ස්වේච්ඡා සේවකයෙකු විසින් සිදු කරන ලදැයි කියනු ලබන හැසිරීම සිදු කළ බවට යමෙකුට සාධාරණ විශ්වාසයක් තිබිය යුතුය.

සාධාරණ විශ්වාසය සැකයට වඩා වැඩි නමුත් එයට සාධක අවශ්‍ය නොවේ. සාධාරණ විශ්වාසයක් ඇති වූ පසු, සංවිධානයේ ප්‍රධානියා හෝ නම් කරන ලද තැනැත්තා එම චෝදනාව කොමිෂන් සභාවට වාර්තා කළ යුතු අතර, ඔවුන් විශ්වාසයන් පිළිගන්නේද නැතිද යන්න නොසලකා විමර්ශනය කළ යුතුය.

සංවිධානයේ ප්‍රධානියා හෝ නම් කරන ලද තැනැත්තා වාර්තා කළ හැකි **සියලු** චෝදනා කොමිසමට දැනුම් දිය යුතු ම අතර වාර්තා කළ හැකි සෑම චෝදනාවක්ම විමර්ශනය කළ යුතුය.

වයස අවුරුදු 18 ට අඩු ඕනෑම දරුවෙකුට එරෙහිව වැඩිහිටියෙකු ඉහත ලැයිස්තුගත කර ඇති හැසිරීම් පහෙන් එකක් කළහොත් වාර්තා කළ හැකි හැසිරීමක් සිදු විය හැකිය. දරුවා සංවිධානයට සම්බන්ධ වුවත් නැතත්, දරුවෙකු සම්බන්ධ හැසිරීම මෙයට ඇතුළත් වේ. දරුවෙකු වාර්තා කළ හැකි හැසිරීමක් කළ නොහැකිය, කෙසේ වෙතත්, ළමයෙකු සම්බන්ධ වූ ළමා සිදුවීමක් සම්බන්ධයෙන් වැඩිහිටියන්ගේ කාර්යභාරය වාර්තා කළ හැකි හැසිරීමක් තිබිය හැකිය.

## වාර්තා කළ හැකි හැසිරීම් සඳහා ක්‍රියාමාර්ග ආරම්භ කිරීම



## චෝදනාවක් කළ විට

සියලුම චෝදනා කොමිසමට වාර්තා කිරීමට සංවිධානයේ ප්‍රධානියාගේ හෝ නාමිකයාගේ අවධානයට ව්‍යාපාරික දින තුනක් (3) ඇතුළත යොමු කළ යුතුය. දිනදර්ශන දින තිහක් (30) ඇතුළත ගෙන ඇති ඕනෑම ක්‍රියාමාර්ගයක් පිළිබඳව ද කොමිසමට දැනුම්දිය යුතුය.

චෝදනාව සාපරාධී හැසිරීමක් නම්, හැකි ඉක්මනින් පොලිසියට දැනුම් දිය යුතුය. දැනුම් දිය යුතු නිලධාරීන් ආගමික සංවිධානය තුළ ද සිටිය හැකිය. චෝදනාව වාර්තා කළ හැකි හැසිරීමක් ගැන ද යන්න ඔබට සැක සහිත නම්, කොමිසමෙන් වැඩිදුර උපදෙස් ලබා ගැනීමට ඔබව දිරිමත් කරනු ලැබේ.

### විමර්ශන ක්‍රියාවලිය

1. චෝදනාව පොලිසියට වාර්තා කරන්න (අපරාධයක් නම්)
2. චෝදනාව වාර්තා කළ හැකිදැයි තක්සේරු කරන්න
3. කොමිසමට චෝදනා වාර්තා කරන්න (ව්‍යාපාරික දින 3)
4. පරීක්ෂණයක් සැලසුම් කර පවත්වන්න
5. සවිස්තරාත්මක හා සාධාරණ පරීක්ෂණයක් පවත්වන්න
6. විමර්ශන වාර්තාවක් සම්පූර්ණ කරන්න
7. සොයාගැනීම් ක්‍රියාත්මක කිරීම හෝ නිර්දේශ කරන්න
8. සොයාගැනීම් කොමිසමට වාර්තා කරන්න

වාර්තා කළ හැකි හැසිරීම්වලට සම්බන්ධ විය හැකි සියලුම වාර්තා කළ හැකි හැසිරීම් සහ විෂමාචාර විමර්ශනය කළ යුතුය. චෝදනාව විමර්ශනය කිරීමට පොලිසිය තීරණය කරන්නේ නම්, ආගමික සංවිධානය තමන්ගේම පරීක්ෂණයක් පැවැත්වීමට පෙර පොලිස් අවසරය ලබා ගැනීම සඳහා බලා සිටිය යුතුය. අනෙක් සෑම අවස්ථාවකම සංවිධානයේ ප්‍රධානියා කරුණු තහවුරු කර ගැනීම සඳහා පරීක්ෂණයක් පත් කිරීම සහ අධීක්ෂණය කිරීම අවශ්‍ය වන අතර චෝදනාව (වාර්තා කළ හැකි හැසිරීම) පිළිබඳව වාර්තා කළ යුතු වේ.

## වාර්තා කළ හැකි හැසිරීමක් පිළිබඳ පරීක්ෂණයක් ආරම්භ කිරීම

සංවිධානයේ ප්‍රධානියා හෝ නම් කරන ලද තැනැත්තා වාර්තා කළ හැසිරීම පිළිබඳ චෝදනාවක් විමර්ශනය කිරීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයෙකු පත් කළ යුතුය. මොහු සංවිධානයේ පුද්ගලයෙක් හෝ ස්වාධීන විමර්ශකයෙකු විය හැකිය. චෝදනාවට අදාළව සැබෑ හෝ පැහැදිලි උනන්දු තත්ත්වයක් තිබේ නම් හෝ ඊට සම්බන්ධ පුද්ගලයින්ගෙන් කිසිවෙකු විමර්ශකයින් ලෙස පත් නොකළ යුතුය.

පරීක්ෂණයකට සම්මුඛ පරීක්ෂකයින් හඳුනා ගැනීම සහ සාධක ප්‍රභව වැනි කාරණාවලට පැහැදිලි විමර්ශන කොන්දේසි සහ සැලැස්මක් තිබිය යුතුය. දරුවෙකු සම්මුඛ පරීක්ෂණයට ලක් කිරීමේ ප්‍රවේශය වැඩිහිටියෙකු සම්මුඛ පරීක්ෂණයට වඩා වෙනස් වන අතර ඒ සඳහා ප්‍රවේශමෙන් සිතා බැලීම හා සැලසුම් කිරීම අවශ්‍ය වේ. සමහර විට දරුවා සමඟ සම්මුඛ සාකච්ඡා කිරීම සඳහා නිශ්චිත පුහුණුවක් හා විශේෂඥතාවයක් ඇති අයෙකුගෙන් උපකාර පැතීම විමර්ශකයාට යෝග්‍ය වේ. චෝදනාව ලැබූ කෙනා සමඟ ඕනෑම සම්මුඛ සාකච්ඡාවක් සඳහා වේලාව පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

### පරීක්ෂණ සඳහා වන සාක්ෂි

**සඳහා ඇතුළත් විය හැක්කේ:**

- භෞතික සාධක උදා. ජංගම දුරකථන, ඉ-තැපැල්
- ක්ෂේත්‍ර පරීක්‍ෂණය උදා. ඡායාරූප, චිත්‍ර
- ඍජු සාධක උදා. සාක්ෂිකරුවන්, සම්මුඛ සාකච්ඡා
- විශේෂඥ සාධක උදා. වෛද්‍යවරුන්, තොරතුරු තාක්ෂණ විශේෂඥයින්

## වාර්තා කළ හැකි හැසිරීම පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීම

විමර්ශනයක් අතරතුර පවත්වන ලද සම්මුඛ සාකච්ඡා සඳහා මග පෙන්වීම සඳහා මූලධර්ම ගණනාවක් තිබේ:

- දරුවන්ගේ ආරක්ෂාව ඉතා වැදගත් වෙයි
- පෞද්ගලිකත්වය සහ රහස්‍යභාවය - සම්මුඛ පරීක්ෂණවල අන්තර්ගතය දැනගත යුත්තේ දැනගත යුතු අය පමණි
- සංස්කෘතික හා ආගමික සංවේදීතාව - සම්ප්‍රදායවලට සහ විශ්වාසවලට ගරු කළ යුතුය
- කාර්ය පටිපාටික සාධාරණත්වය - මිනිසුන්ට සාධාරණ හා ගෞරවයෙන් සැලකිය යුතුය.

විමර්ශනය සාධක රැස් කර තක්සේරු කළ යුතු අතර, වාර්තා කළ හැකි හැසිරීමක් සිදු වී නොමැතිද යන්න සලකා බැලිය යුතුය.

සංවිධානයේ ප්‍රධානියාට හෝ විමර්ශකයාගෙන් නම් කරන ලද තැනැත්තාට කරන ලද වාර්තාව මඟින් චෝදනාව සනාථ කෙරෙන්නේද, සනාථ නොකෙරෙන්නේද, පදනම් විරහිත හෝ යෝජනා ක්‍රමයේ විෂය පථයෙන් පරිබාහිරව සිදු කෙරේද යන්න සඳහන් කළ යුතුය.

කොමිසම විසින් සාමාන්‍යයෙන් සොයා ගැනීම් Working with Children Check ඒකකය වෙත යොමු කර Working with Children Check හි චෝදනාව පිළිබඳ අදහස් ලබා ගැනේ.

### විමර්ශන වාර්තාවක සොයාගැනීම් වර්ග

**සම්භාවිතාවල සමබරතාවය මත, චෝදනාව:**

- **සනාථ වූ**
- **සනාථ නොවූ**
- **පදනම් විරහිත**
- **යෝජනා ක්‍රමයෙන් පිටත හැසිරීමක් විය හැක**

**සොයාගැනීම් වර්ග පිළිබඳ වැඩි විස්තර කොමිෂන් සභාවේ වෙබ් අඩවියෙන් සොයාගත හැකිය.**

### වාර්තා කළ හැකි චර්යා යෝජනා ක්‍රමය පිළිබඳ වැඩිදුර තොරතුරු ලබා ගැනීමට:

**වෙබ් අඩවිය: ccyp.vic.gov.au/reportableconduct**

**ඉ-තැපෑල: contact@ccyp.vic.gov.au**

**දුරකථන අංක: 03 8601 5281 හෝ 1300 782 978**

Interpreter

**ඔබට පරිවර්තකයෙකු අවශ්‍ය නම්, 13 14 50 අංකයට පරිවර්තන හා අර්ථකථන සේවාව අමතා 03 8601 5281 අංකයෙන් ළමයින් හා තරුණයින් සඳහා වූ කොමිෂන් සභාව සම්බන්ධ කිරීමට ඉල්ලා සිටින්න.**

# වාර්තා කළ හැකි චර්යා යෝජනා ක්‍රමය සහ ළමා සුරක්ෂිත ප්‍රමිති සම්පත්

## වාර්තා කළ හැකි චර්යා යෝජනා ක්‍රමයේ තොරතුරු පත්‍රිකා - සංවිධාන සඳහා මාර්ගෝපදේශ

https://ccyp.vic.gov.au/rcs-factsheets

1. වාර්තා කළ හැකි චර්යා යෝජනා ක්‍රමය ගැන
2. වාර්තා කළ හැකි හැසිරීමක් යනු කුමක්ද?
3. සංවිධානයේ ප්‍රධානියාගේ වගකීම්
4. විමර්ශන දළ විශ්ලේෂණය
5. වෙනත් වාර්තාකරණ බැඳීම්
6. ළමා සුරක්ෂිත ප්‍රමිති සහ වාර්තා කළ හැකි හැසිරීම් යෝජනා ක්‍රමය
7. කොමිසමට වාර්තා කිරීම
8. විමර්ශණයේ සොයාගැනීම්
9. ලිංගික විෂමාචාර
10. ශාරීරික හිංසනය
11. සැලකිය යුතු නොසලකා හැරීම
12. අතීත චෝදනා
13. සේවකයන් සහ ස්වේච්ඡා සේවකයන්
14. ස්වයං පරීක්ෂණ පැවැත්වීම

## පරිවර්තනය කළ තොරතුරු පත්‍රිකා

https://ccyp.vic.gov.au/child-safety/resources/translated-information-sheets

- අරාබි
- බුරුම
- චීන (සරල)
- චීන (සාම්ප්‍රදායික)
- දාරි
- ඩින්කා
- ඉංග්‍රීසි (සරල)
- ග්‍රීක
- හින්දි
- ඉන්දුනීසියානු
- කොරියානු
- පෂ්ටෝ
- පර්සියානු - ෆාර්සි
- පන්ජාබි
- සෝමාලි
- වියට්නාම




## සංවිධාන සඳහා මාර්ගෝපදේශ - වාර්තා කළ හැකි චර්යා චෝදනාවක් විමර්ශනය කිරීම

https://ccyp.vic.gov.au/guides




## ළමා ආරක්ෂිත සංවිධානයක් ඇති කිරීම සඳහා මාර්ගෝපදේශය




## වීඩියෝ සහ ඉදිරිපත් කිරීම්

https://ccyp.vic.gov.au/guides



COMMISSION FOR CHILDREN
AND YOUNG PEOPLE